ඉඩම් මැනුම් සභාව - **2021**

--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ඉඩම් මැනුම් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සභාවේ ප්‍රධානතම ආදායම් මාර්ගය වන බලපත්‍ර ආදායම්වලින් වර්ෂයට අදාළ නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් සභාව විසින් අනුගමනය නොකර සභාවේ බැංකු ගිණුමට බලයලත් මිනින්දෝරුවරු විසින් තැන්පත් කරන මුදල් මත පදනම්ව රු. 5,111,652 ක් මෙම වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් ආදායම් ලෙස පෙන්වන රු. 5,111,652 ක් වූ මෙම ලැබීම්වලට අදාළ තනි පුද්ගල ගිණුම් හඳුනාගෙන නොතිබුණු අතර ආදායම් සැසඳීමක්ද සිදුකර නොතිබුණි. මේ අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ආදායමෙහි නිවැරදිතාවය පිලිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. | ඉඩම් මැනුම් සභාව ආරම්භයේ සිටම ඉඩම් මැනුම් සභාව වෙත කරනු ලබන ගෙවීම්වලට අදාළ විස්තර හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදයක් තිබී නොමැත. ඒ අනුව 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනයෙහි හඳුනානොගත් ආදායම් ලෙස රු. 5,111,652 ක් දක්වා ඇත. කෙසේවුවද 2022 වර්ෂයේ සිට බලපත්‍ර ආදායම් සඳහා තනි පුද්ගල ගිණුම් තැබීම යටතේ ගිණුම් ගත කර එකී ආදායම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම ගැටලුව තව දුරටත් ඇති නොවනු ඇත. | බලපත්‍ර ආදායම්වලින් වර්ෂයට අදාළ නිවැරදි ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ 6.5.3 ජේදය | විගණනය කරන ලද අවසාන ගිණුම් සහ විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද , සභාවේ 2018, 2019 සහ 2020 වර්ෂවල වාර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | 2018, 2019 හා 2020 යන වර්ෂයන් සඳහා වූ වාර්ෂික වාර්තා පිළිබඳව විගණන මතය හා එකඟ වේ. | 2018, 2019 සහ 2020 වර්ෂවල වාර්ෂික වාර්තා කඩිනමින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23 (1) (අ) | තොරතුරු නිලධාරියකු පත් කර නොතිබුණි. | තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු නිලධාරියෙකු හෝ නම් කළ නිලධාරියෙකු පත්කර නොමැත. තොරතුරු ඉල්ලීමක් ලැබුණු විට එය සභාව විසින් තීරණය කර නිකුත් කරනු ලබයි. | පනතේ රෙගුලාසි අනුව තොරතුරු නිලධාරියෙකු පත් කළ යුතුය. |
| (ඇ) 2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනත | | | |
| (i) 37 (උ) | ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය , පුහුණුව , පිළිගැනීම යන කරුණුවලදී සම තත්ත්වයක් සහ අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් නිසි පරිදි ඉටු කර නොතිබුණි. | ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව පිළිගැනීම යන කරුණුවලදී සමානතාවයක් හා අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරීමේ මූලික ක්‍රියාමාර්ගයක් ලෙස ස්වාධීන ආයතනයක් වශයෙන් ඉඩම් මැනුම් සභාවද මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා දියතලාව මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයෙහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. | පනත අනුව ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව, පිළිගැනීම යන කරුණුවලදී විදේශීය බලධරයන් සමග අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇති කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) ) 38 (ඇ) | සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් ප්‍රමාණවත් පරිදි පත් කර නොතිබුණි. | ඉඩම් මැනුම් සභාව සඳහා අනුමත වී ඇති කළමනාකරණ සේවා නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගැනීමේ පරිපාටිය 2021 ඔක්තෝබර් 08 දින ඉදිරිපත් කර ඇත. එයට කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී නොමැත. එය අනුමත වූ වහාම අදාළ බඳවා ගැනීම් සිදු කළ හැකිවේ. | සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 38 (උ) | සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සිදු කර නොතිබුණි. | සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති මාලාවක් සකස් කර නොමැති අතර 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධානවලට අනුව සභාවේ කටයුතු පරිපාලනය කරනු ලැබේ. | සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීමට කටයුතු කළ යුතුය. |
| (iv) 46 | මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ 2020 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 113 න් 80 ක්ද, 2021 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 143 න් 104 ක්ද විසඳා නොතිබුණි. | ලැබී තිබුණු පැමිණිලිවලින් 2020 වර්ෂයේ 80 ක්ද, 2021 වර්ෂයේ 104 ක්ද විසදීමට නොහැකි වූයේ, රටේ පැවති අයහපත් සෞඛ්‍ය හේතූන් මත වැඩි කාලයක් රට වසා තැබීම, සභා රැස්වීම් හා උප කමිටු පැවැත්වීම සීමා කිරීමට සිදුවීම, සැලසුම් කලද විමර්ශන පැවැත්වීමට නොහැකි වීම සහ කැඳවීම් සඳහා අදාළ පාර්ශවයන්ට සහභාගි වීමට නොහැකි වීම යන හේතු මත වේ. | මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කඩිනම් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (v) 32 (1) | සභාව විසින් ස්ථිර ලේකම්වරයෙකු පත් කර ගැනීමට 2002 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නොහැකිවී තිබුණි. | අවස්ථා කිහිපයකදීම උත්සාහ කර ඇති නමුත් ලේකම්වරයෙකු පත් කර ගැනීමට නොහැකි විය. ස්ථිර ලේකම් වරයෙකු පත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ පුවත්පත් දැන්වීම් හා ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. | සභාව සඳහා ස්ථිර ලේකම්වරයෙකු පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තියේ, තුන්වන උපලේඛනයේ සඳහන් ආයතන පමණක් බදු ගෙවීමෙන් නිදහස් කර තිබුණි. ඉඩම් මැනුම් සභාව එහි සඳහන් ආයතනයක් නොවන නමුත් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, බදු ගෙවීමෙන් නිදහස් වී ඇත්නම් ඒ සඳහා ලැබී ඇති අනුමැතීන් කිසිවක් පිළිබඳ සාක්ෂිද විගණනයේදී නිරීක්ෂණය නොවීය. | ඉඩම් මැනුම් සභාව ආදායම් බදු ගෙවීමෙන් නිදහස් කරන ලෙස ඉල්ලා 2022 මාර්තු 22 දින දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇතත් මේ වන තෙක් එයට පිළිතුරු ලැබී නොමැත . | පනත අනුව බදු ගෙවීමට හෝ ඉන් නිදහස් වීමට කරුණු වේ නම් ඒ සඳහා කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 958,915 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,868,355 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,909,440 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අනෙකුත් ආදායම් සහ වැඩමුලු ශුද්ධ ආදායම රු. 2,123,610 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

වැඩමුලු නොපැවැත්වීම හේතුවෙන් වැඩමුලු ආදායමක් ලැබී නොතිබුණු අතර, අනෙකුත් ආදායම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 64 කින් පහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2021 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් 1 : 0.38 ක් හා 1 : 0.40 ද ක්ෂණික වත්කම් අනුපාතය 2021 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් 1 : 0.39 ක් හා 1 : 0.40 ක් ද විය.